# කාර්ය සාධන වාර්තාව

## 2011

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාව

# පෙරවදන

ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය ජනතා ව්‍යවසායක් ලෙස සංවර්ධනය කිරීම සඳහා සානුබල සපයමින් සමුපකාර ආයතනවල යහපාලනය ගොඩනැගීම සඳහා පුළුල් ලෙස මැදිහත්වීම මධ්‍යම රජයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මෙහෙවරයි.

2011 වසර සඳහා පරිච්ඡේද 05 කින් සකස් කල කාර්ය සාධන වාර්තාව ඔබ අතට මෙසේ පත්කිරීමට ලැබීම සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ 47 වන කොමසාරිස්වරයා වශයෙන් මා හට ඉමහත් සතුටකි.

සමුපකාර ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ග්‍රාමීය, වතු, නාගරික, ධීවර, කෘෂිකර්මාන්ත සහ කර්මාන්ත යන ආර්ථික අංශවල මෙන්ම සේවා ආර්ථිකයේත් ප්‍රාථමික සමුපකාර සමිති, දිස්ත්‍රික් සමුපකාර සංගම් හා ජාතික සමුපකාර සංගම් ලෙස ව්‍යාප්ත වී ඇත. පළාත් සභා ක්‍රමය සංස්ථාපනය වීමෙන් පසු පළාත් සමුපකාර අමාත්‍යාංශ නවයක් යටතේ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරුන් නව දෙනෙකු මගින් සමුපකාර සමිති හා සංගම් අධීක්ෂණ කටයුතු ක්‍රියාත්මක වේ. මීට අමතරව මධ්‍යම රජය යටතේ ක්‍රියාත්මක වන සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් දීප ව්‍යාප්ත සමුපකාර සමිති සහ මුදුන් මට්ටමේ සමුපකාර සංගම් වල අධීක්ෂණ කටයුතු ක්‍රියාත්මක වේ.

මෙම වාර්තාවේ අන්තර්ගත වන්නේ මධ්‍යම රජයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මෙහෙවර තුළින් 2011 වසරට අදාළව ලබාගත් දත්ත හා තොරතුරු වේ. මෙහි පළමු පරිච්ඡේදයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා ව්‍යුහය අඩංගු වන අතර, දෙවන පරිච්ඡේදයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් විස්තර කර ඇත. තුන්වන පරිච්ඡේදයේ ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරයේ ජාතික මට්ටමේ සමුපකාර සමිති සංගම් පිළිබඳ තොරතුරු ද හතරවන පරිච්ඡේදයේ ශ්‍රී ලංකාව බල ප්‍රදේශය කර ගත් ආයතනික හා ආයතනික නොවන සමුපකාර සමිති පිළිබඳ දත්ත හා තොරතුරු ද ඇතුලත් කර ඇත. පස්වන පරිච්ඡේදයෙන් රාජ්‍ය අයවැය ලේඛනයෙන් වෙන්කර ඇති ප්‍රතිපාදන සහ ජාතික මට්ටමේ සමුපකාර සංගම්වල සාමාජික හා සේවක සංඛ්‍යාව ද ඇතුලත් කර ඇත.

මෙම වාර්තාව අධ්‍යයනය කරන විට මධ්‍යම රජයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්වභාවය හා ස්වරූපයත්, මධ්‍යම රජයට සෘජුවම අයත් සමුපකාර ආයතන පිළිබඳවත් දත්ත හා තොරතුරු ලබා ගැනීමට හැකිවේ. සමුපකාර ව්‍යාපාරයේ මෑත ඉතිහාසය අධ්‍යයනය කරන විට කොළඹ ආදිපාද වීදියේ පවත්වා ගෙන ගිය සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල අහිමිවීම, සමුපකාර බුද්ධි අංශය වශයෙන් පොල්ගොල්ලේ පවත්වා ගෙන ගිය ශ්‍රී ලංකා සමුපකාර විද්‍යාලය සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අහිමි වීම හා සමුපකාර ව්‍යාපාරයේ සමුපකාර සමිති හා සංගම් සඳහා උපදේශන සේවාවන් ලබා දුන් සමුපකාර කළමනාකරණ සේවා ආයතනය අහිමිවීම වත්මන් සමුපකාර ව්‍යාපාරයේ පැවැත්මට අහිතකර බලපෑමක් ඇතිකර ඇති බව මෙහිදී පෙන්වා දිය හැකිය.

ජාතික සමුපකාර සංවර්ධන ආයතනයත්, සමුපකාර සේවක කොමිෂන් සභාවත්, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ සහජීවනයෙන් කටයුතු කරන ආයතන වේ.

සමුපකාර ව්‍යාපාරයේ හර පද්ධතිය හඳුනා ගනිමින් ජාතික සංවර්ධනයට සමුපකාරය දායක කරගැනීමට වත්මන් ගරු අමාත්‍යතුමා ගන්නා උත්සාහයත්, කැපවීමත්, මඟ පෙන්වීමත්, මෙන්ම අමාත්‍යාංශ ලේකම්තුමන් ලබාදෙන සහයෝගය හා මගපෙන්වීමත්, අධීක්ෂණයත්, "මහින්ද චින්තන ඉදිරි දැක්ම" වැඩපිළිවෙල යටතේ සමුපකාරය ගොඩනැගීමට මහත් රුකුලක් වී ඇත. එය තවදුරටත් ශක්තිමත් වීමට නම් ව්‍යාපාරය පිළිබඳ අධ්‍යාපන හා පුහුණු කටයුතු වලට අමතරව පර්යේෂණාත්මක කටයුතු මෙන්ම සමුපකාර සාහිත්‍යයක් විචාර පූර්වක ආකල්පයෙන් ගොඩනැගිය යුතු අතර, එය මෙරට බුද්ධිමතුන්ගේ කාර්යභාරයක් කරගත යුතුව ඇත.

ගත වූ කාලය තුල පළාත් සමුපකාර අමාත්‍යවරුන් පළාත් සමුපකාර අමාත්‍යාංශ ලේකම්වරුන් හා පළාත් සමුපකාර කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරුන් මධ්‍යම රජයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සමග යහපත් අන්තර් සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම අගය කළ යුතුව ඇත.

සමුපකාර ව්‍යාපාරයේ ගමන් මග නව මගකට යොමු කරමින්, රාජ්‍ය ප්‍රතිපත්ති සමග සමුපකාර ව්‍යවසායකත්වය පාදක කරගෙන සමුපකාර භාවිතයන් ආර්ථික ව්‍යවසායක සංවිධානයක් හා සමාජ ව්‍යවසායක සංවිධානයක් වශයෙන් භාවිතයට ගෙන, සංවිධානය කර පවත්වාගෙන යාමේ අවශ්‍යතාව සියළු සමුපකාර නායකයින්ගේ අවධානයට යොමු විය යුතු බව පෙන්වා දීමට කැමැත්තෙමි.

මෙම වාර්තාව පරිශීලනය කරන අයගෙන් අප ඉල්ලා සිටින්නේ ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරයේ දියුණුවට අදාලව ඔබ දරණ අදහස සාක්ෂාත් කර ගැනීම සඳහා සමුපකාර භාවිතය ජාත්‍යන්තරව පිළිගත් සමුපකාර නියමයන් මත ගොඩනැගීමට එක්වන ලෙසය.

**ඩබ්ලිව්. එච්. කරුණාරත්න**
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

## දර්ශනය

ජනතා ව්‍යවසායක් ලෙස තිරසාර සංවර්ධනයට සමුපකාරය

## මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය

ජනතා ව්‍යවසායක් ලෙස සංවර්ධනය කිරීම සඳහා

සානුබල සපයමින්,

සමුපකාර සමිතිවල යහ පාලනය

ගොඩනැගීම සඳහා

පුළුල් ලෙස මැදිහත් වීම.

# පටුන


1. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා ව්‍යුහය
    - 1.1 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය
    - 1.2 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යුහය
    - 1.3 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය
        - 1.3.1 කාර්යමණ්ඩල සංඛ්‍යා හා පුරප්පාඩු
        - 1.3.2 කාර්යමණ්ඩල විශ්‍රාම ගැන්වීම්
        - 1.3.3 ස්ථාන මාරුවී ගිය නිලධාරීන්
        - 1.3.4 නව පත්වීම්/ ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන්
    - 1.4 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සහ සංවර්ධනය
        - 1.4.1 දේශීය පුහුණු
        - 1.4.2 විදේශීය පුහුණු
2. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවර්ධන ක්‍රියාකාරකම්
    - 2.1 වර්ෂය තුල ක්‍රියාත්මක සමුපකාර සමිති / සංගම් ලියාපදිංචි කිරීම් හා ඇවර කිරීම්
    - 2.2 සමුපකාර සමිතිවල අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම්
    - 2.3 සමුපකාර සමිතිවල ව්‍යවස්ථාපිත විගණන කටයුතු
    - 2.4 නීති කටයුතු
        - 2.4.1. 2011 වර්ෂය තුළ සමුපකාර සමිති/ සංගම් වල ආරවුල් බේරුම් කිරීම හා ප්‍රදානයන් බල ගැන්වීම
        - 2.4.2. 2011 වර්ෂය තුළ අවසන් වූ නඩු
    - 2.5 අරමුදල් කළමනාකරණය
        - 2.5.1 සමුපකාර සංවර්ධන අරමුදල
        - 2.5.2 සමුපකාර සංවර්ධන අතිරික්ත අරමුදල
    - 2.6 සංවර්ධන කටයුතු
3. ජාතික මට්ටමේ සමුපකාර සංවිධාන
4. දීප ව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සමිති
    - 4.1 දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති
        - 4.1.1. දීප ව්‍යාප්ත ආයතනික සේවක ස.ණ.ස. සමිති
        - 4.1.2. දීප ව්‍යාප්ත වෙනත් මූල්‍ය සේවා සමිති
    - 4.2 දීප ව්‍යාප්ත නිෂ්පාදන හා වෙනත් සේවා සමිති
5. උපලේඛන

# 1 පරිච්ඡේදය

# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

## 1. 1 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

1930 වසරේ ආරම්භවූ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වර්තමානයේදී සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. 2011 වසර මුල් භාගයේදී මෙම දෙපාර්තමේන්තුව කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, ස.තො.ස. මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ 05 වන මහලේ ස්ථාපිත කර තිබූ අතර 2011 වසර අගභාගයේදී කොළඹ 02, යූනියන් පෙදෙසෙහි, අංක 330 දරණ වත්මන් කාර්ය ස්ථානය වෙත ගෙන එන ලදී.

### සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යයන්

- ❖ අන්තර් පළාත් හා සමස්ත ලංකා මට්ටමේ සමුපකාර සමිති, සංගම් හා තෘතිය සමුපකාර ආයතන ලියාපදිංචිය.
- ❖ ලියාපදිංචි සමුපකාර සමිති, සංගම් හා තෘතීය සමුපකාර ආයතන වල ව්‍යවස්ථාපිත කටයුතු මෙහෙයවීම සහ සංවර්ධනයට අදාල කටයුතු සිදු කිරීම.
- ❖ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු හා සම්බන්ධීකරණය වෙමින් ජාතික ප්‍රතිපත්තියක් තුළ සමුපකාර ව්‍යාපාරයේ කටයුතු මෙහෙයවීම.
- ❖ ජාතික සමුපකාර සංවර්ධන ක්‍රියාදාමයන්ට සහාය වීම.
- ❖ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධනාත්මක දායකත්වය සැපයීම.

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවටම අනන්‍ය වූ කාර්යයන් ද වේ. ඒ අතරින් ප්‍රමුඛත්වය හිමි කාර්යයන් පහත සඳහන් වේ.

### සමුපකාර සමිති ව්‍යවස්ථාපිත කටයුතු

- ❖ සමිති ලියාපදිංචි කිරීම
- ❖ සමිති ඒකාබද්ධ හා විබද්ධ කිරීම
- ❖ සාමාජිකත්වය පිළිබඳ කටයුතු
- ❖ අතුරු ව්‍යවස්ථා හා සංශෝධනයන් අනුමත කිරීම
- ❖ ප්‍රාදේශීය කාරක සභා ඇතුළු නිළවරණ කටයුතු

- මහා සභා කැඳවීම/ කාරක සභා කැඳවීම
- මහා සභා පැවැත්වීම්/ වලංගු භාවය තීරණය කිරීම
- ලියාපදිංචිය අවලංගු කිරීම
- ලියාපදිංචි සමුපකාර සමිති විසුරුවා හැරීම
- සමිති ඈවර කිරීම
- තීරකකරණ කටයුතු සහ උසාවි බලගැන්වීම්
- සමුපකාර සමිති/ සංගම් වල වාර්ෂික විගණනයන් සිදු කිරීම

## සමුපකාර සමිති කළමනාකරණයට අදාළ කටයුතු

- පාලක මණ්ඩල පත් කිරීම/ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත්කිරීම
- දේපළ පිළිබඳ අනුමැතිය දීම
- අයිතිවාසිකම් අත්හැර දැමීම පිළිබඳ කටයුතු
- ණය, ආයෝජන සම්බන්ධ අනුමැතිය ලබා දීම
- සමිතිවල උපරිම ණය සීමාවන් තීරණය කිරීම
- අයවැය ඇස්තමේන්තුකරණය
- ගිණුම් කටයුතු පිළිබඳ අධීක්ෂණය
- විගණන කටයුතු
- පනතේ විධිවිධාන පරිදි සාමාන්‍ය/ විශේෂ විභාග හා පරීක්ෂණ පැවැත්වීම
- කළමනාකරණ අධ්‍යාපනය සහ උපදෙස් දීම

## සම්බන්ධීකරණ කටයුතු

- සමුපකාර අමාත්‍යාංශය හා වෙනත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය.
- පළාත් සමුපකාර අමාත්‍යවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් හා පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරුන් සමඟ සම්බන්ධීකරණය සඳහා සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයට සහය වීම.
- ජාත්‍යන්තර සමුපකාර සන්ධානය සහ විදේශීය සමුපකාර ආයතන සම්බන්ධීකරණය
- සමුපකාර ග්‍රාමීය බැංකු හා සමුපකාර මූල්‍ය ආයතන පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සම්බන්ධීකරණය
- සමුපකාර සමිති වලට අදාල සංඛ්‍යා ලේඛන පිළිබඳව මහ බැංකුව හා ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය
- වී මිලදී ගැනීම, සහන මිලට පොහොර බෙදාහැරීම වැනි කටයුතු වලදී සමුපකාර සමිති, කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණය කිරීම
- සමුපකාර සමිති/ සංගම් අතර සම්බන්ධීකරණය

### සංවර්ධන කටයුතු

- ❖ වාර්ෂික අයවැය ප්‍රතිපාදන අනුව ජාතික මට්ටමේ සහ පළාත් මට්ටමේ සංවර්ධන කාර්යයන් ඉටුකිරීම.
- ❖ සමුපකාර සමිති වල යහ පාලනය සහතික කිරීමට අදාල කටයුතු ඉටු කිරීම.
- ❖ සමුපකාර සමිති හා සංගම් වල සංවර්ධනය සඳහා සංවර්ධන උපදේශන සේවා සැපයීම.
- ❖ සමුපකාර සමිති හා සංගම් වල මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරකම් අධීක්ෂණය.
- ❖ සංවර්ධන ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම.
- ❖ සංවර්ධන ආධාර හා සානුබල සැපයීම.
- ❖ සංවර්ධන මාර්ගෝපදේශ සැපයීම හා සම්බන්ධීකරණය.
- ❖ සමුපකාර ක්ෂේත්‍රයේ සහ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය.
- ❖ සේවක / නිලධාරි සුභ සාධනය.

### අරමුදල් පාලනය

- ❖ දෙපාර්තමේන්තුව යටතේ ඇති සමුපකාර අරමුදල සහ අතිරික්ත අරමුදල කළමනාකරණය හා පාලනය.
- ❖ ව්‍යවස්ථාපිත සමිති වල වාර්ෂික විගණනයෙන් පසු වෙන්කරනු ලබන දායක මුදල් අයකර ගැනීම.
- ❖ සමුපකාර සමිතිවල සංවර්ධන ව්‍යාපෘති හා පුහුණු කටයුතු සඳහා ණය සහ ආධාර ලබා දීම.
- ❖ ණය ආපසු අයකරගැනීම.
- ❖ ඵලදායි ලෙස අරමුදල් ආයෝජනය කිරීම.

### අභ්‍යන්තර පරිපාලන හා කළමනාකරණ කටයුතු


- ❖ දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලනය.
- ❖ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් කළමනාකරණය.
- ❖ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය වර්ධනය.
- ❖ දෙපාර්තමේන්තු වත්කම් කළමනාකරණය.

## 1.2 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යුහය

2011 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය අංශ 06 ක් ලෙස සංවිධානය වී ක්‍රියාත්මක වී ඇත. එනම්

1. පාලන අංශය
2. මුදල් අංශය
3. සංවර්ධන අංශය
4. විගණන අංශය
5. නීති අංශය
6. අරමුදල් අංශය

# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



## 1.3 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි කාර්ය මණ්ඩලය

සමුපකාර සංවර්ධන කොමසාරිස් රෙජිස්ට්‍රාර් තනතුරෙහි සේවය කළ ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි I පන්තියේ ඒ.ජී.පී කිත්සිරි මහතා සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයෙහි අතිරේක ලේකම් (සමුපකාර) තනතුර සඳහා ස්ථාන මාරුවීම හා එම තනතුරෙහි වැඩ බැලීම සඳහා අමාත්‍යාංශ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් පී. එච්. ආනන්ද මහතා (ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි I පන්තිය) පත්වීමත්, 2011.12.28 දින සිට සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි I පන්තියේ ඩබ්ලිව්. එච්. කරුණාරත්න මහතා පත්වීමත් 2011 වසර තුළ සිදු වූ සුවිශේෂි සිදුවීම්ය.

එමෙන්ම රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට පත්වීම් ලද නවක නිලධාරින් 14 දෙනෙකු මෙම දෙපාර්තමේන්තුවට එකවර අනුයුක්ත කිරීම දෙපාර්තමේන්තුව ලද විශාල ජයග්‍රහණයක් විය.

නමුත් මෙම වසර තුළ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ පළපුරුදු නිලධාරින් බහුතරයක් ස්ථාන මාරු වී යාම ප්‍රශස්ථ මට්ටමේ කාර්ය සාධනයක් ලඟා කර ගැනීමට තරමක බාධාවක් විය. 2010 වසර තුළ පැවැති පරිපාලන සේවයේ හා සමුපකාර සංවර්ධන නිලධාරි සේවයේ තනතුරු පුරප්පාඩු එලෙසම මේ වසරේ දීත් පැවති අතර ආයතනයට දැඩි අවශ්‍යතාවයක්ව පවතින පරිපාලන නිලධාරි තනතුර ද 2011 වසර අවසානයේදීත් පුරප්පාඩු වී පැවැතිණි.

### 1.3.1 කාර්ය මණ්ඩල සංඛ්‍යා හා පුරප්පාඩු

කාර්යමණ්ඩලය සංශෝධනය කිරීමෙන් පසු මෙම දෙපාර්තමේන්තුවෙහි අනුමත තනතුරු හා එම තනතුරු වල 2011.12.31 දිනට සේවය කළ සංඛ්‍යාව හා පුරප්පාඩු පහත සඳහන් පරිදි වේ.

| සේවය / තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවයේ සිටි සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (ශ්‍රී.ලං.පරි.සේ. I) | 1 | 1 | - | - |
| සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් (ශ්‍රී.ලං.පරි.සේ. II) | 2 | - | 2 | - |
| සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (ශ්‍රී.ලං.පරි.සේ. III) | 2 | 1 | 1 | - |
| ගණකාධිකාරි (ශ්‍රී.ලං.ගණ.සේ. II/III) | 1 | 1 | - | - |

| සේවය / තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවයේ සිටි සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තු) | 2 | 1 | 1 | - |
| සමුපකාර සංවර්ධන දිස්ත්‍රික් නිලධාරි | 5 | 2 | 3 | - |
| පරිපාලන නිලධාරි | 1 | - | 1 | - |
| භාෂා පරිවර්තක | 1 | - | 1 | - |
| සමුපකාර සංවර්ධන නිලධාරි | 25 | 7 | 18 | - |
| සමුපකාර ප්‍රවර්ධන හා විමර්ෂණ සහකාර | 37 | 32 | 5 | - |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 28 | 24 | 4 | - |
| රියදුරු | 5 | 4 | 1 | - |
| කාර්යාල කාර්ය සහායක | 15 | 10 | 5 | - |
| **උප එකතුව** | 125 | 83 | 42 | - |

## 1.3.2 කාර්ය මණ්ඩල විශ්‍රාම ගැන්වීම්

| | නම | තනතුර | විශ්‍රාම ලැබූ දිනය |
|---|---|---|---|
| 1 | ඒ.කේ. ගුණතිලක මෙනවිය | රාජ්‍ය කළමණාකරණ සහකාර I | 2011.01.08 |
| 2 | එස්. සී. රූපසිංහ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර I | 2011.04.25 |
| 3 | වයි.ඩබ්ලිව්.ආර්. පීරිස් මයා | සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තු) (නීති/විගණන) | 2011.05.07 |
| 4 | කේ.ඩී. කිංස්ටර් මයා | කාර්යාල කාර්ය සහායක I | 2011.08.03 |

## 1.3.3 ස්ථාන මාරුවී ගිය නිලධාරීන්

| | නම | තනතුර | ස්ථාන මාරුවී ගිය දිනය |
|---|---|---|---|
| 1 | ඒ.පි.ජී. කිත්සිරි මයා | සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර් | 2011/7/18 |
| 2 | එස්.පී.එස්. අමරතුංග මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර I | 2011/4/28 |
| 3 | එන්. ඩබ්ලිව් ඒ.එස්. ප්‍රේමතිලක මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2011/4/24 |
| 4 | එම්.එම්.ටී.ජී.පී.එස්. තෙන්නකෝන් මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2011/5/16 |
| 5 | කේ.ඊ.ඩී.ඒ.ඒ රත්නසිරි මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2011/5/16 |
| 6 | කේ.කේ.එස්. පෙරේරා මිය | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශණ සහකාර | 2011/5/19 |
| 7 | ජේ.එම්.ඩබ්.කේ. ජයසුන්දර මිය | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශණ සහකාර | 2011/6/17 |
| 8 | ඩී.ඒ.එම්.පී.බී. දසනායක මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2011/7/4 |
| 9 | කේ.එම්.එම්.සී.එච්. රොඩ්රිගෝ මිය | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශණ සහකාර | 2011/7/4 |
| 10 | ආර්.එම්. දර්ශනී හේරත් මැණිකේ මෙනවිය | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශණ සහකාර | 2011/7/11 |
| 11 | ඒ.ජී.එස්. සඳමාලි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2011/7/11 |
| 12 | ඩබ්ලිව්.එස්.එච්. කුරේ මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2011/7/22 |
| 13 | එස්.ඒ.එල්.පී.කේ. දිසානායක මයා | කාර්යාල කාර්ය සහායක II | 2011/8/22 |
| 14 | එන්.එම්.එස්. ප්‍රනාන්දු මයා | කාර්යාල කාර්ය සහායක I | 2011/9/9 |
| 15 | එම්.එම්.යූ.එම්. ගුණතිලක මිය | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශණ සහකාර | 2011/12/7 |

## 1.3.4 නව පත්වීම්/ ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන්

| | නම | තනතුර | පැමිණි දිනය |
|---|---|---|---|
| 1 | ඩබ්ලිව්. එච්. කරුණාරත්න මයා | සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් | 2011/12/28 |
| 2 | පී.ඩී වීරකෝන් මෙනවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2011/4/11 |
| 3 | ඒ.ඒ.සී.එස්. අමරසිංහ මෙනවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2011/4/11 |
| 4 | එච්.ආර්. සචී මෙනවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2011/4/11 |
| 5 | එස්. ඒ. තලංගම මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2011/4/11 |
| 6 | එෆ්.එස්. කිචිල් මෙනවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2011/4/11 |
| 7 | එස්.එච්. මදුරාවල මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2011/4/11 |
| 8 | එල්.ඒ.ඩී. සිල්වා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2011/4/21 |
| 9 | එම්. මයුරි මෙනවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2011/4/21 |
| 10 | බී.ජී. විනීතා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර II | 2011/5/16 |
| 11 | කේ.ඒ.එන්. රත්නායක මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2011/7/01 |
| 12 | අයි.එස්. තෙවරප්පෙරුම මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2011/7/01 |
| 13 | කේ.එල්.එම්. මල්කාන්ති මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2011/7/01 |
| 14 | කේ.එම්. මිනෝලි මෙනවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2011/7/06 |
| 15 | කේ.එච්.ජී.කේ. කුමාර මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2011/9/15 |
| 16 | ආර්.එම්.පී.එස්. රත්නායක මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර III | 2011/9/15 |

## 1. 4 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ සංවර්ධනය

### 1. 4.1 දේශීය පුහුණු

2011 වර්ෂය තුළ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයන් පහත සඳහන් පරිදි දේශීය අධ්‍යාපන හා පුහුණු පාඨමාලාවන්ට සහභාගි කරවා ඇත.

| | පුහුණු වැඩසටහන | සංවිධානය කළ ආයතනයේ නම | කාලසීමාව | සහභාගි වූ නිලධාරින් |
|---|---|---|---|---|
| 1 | Diploma in Communication Skills in English | මිලෝදා ආයතනය | මාස 06 | එස්.ඒ. තලංගම මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර) එෆ්.එස්. කිවිල් මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 2 | ලේඛන කලමනාකරණය පිළිබඳ පාඨමාලාව | ජාතික ලේඛනාරාක්ෂක දෙපාර්තමේන්තුව | 2011/8/22 සිට 2011/8/26 දක්වා | පී.ඒ. පතිරත්න මෙනවිය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 3 | විද්‍යාත්මක, පිරිමැසුම්දායක හා ආරක්ෂිත රියපැදවීම | ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය | 2011/8/30 දින | එල්.ඒ. නන්දසේන මයා (රියදුරු) |
| 4 | Government Payroll management System | මිලෝදා ආයතනය | 2011/10/3 සිට 2011/10/8 දක්වා | එච්.ආර්.සචී මෙනවිය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 5 | CIGAS | මිලෝදා ආයතනය | 2011/10/24 දින සිට 2011/10/29 දක්වා | ඩී.එස්.යු. මනතුංග මිය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 6 | රාජ්‍ය ප්‍රසම්පාදන කළමනාකරණය | මිලෝදා ආයතනය | 2011/10/24 හා 2011/10/29 දිනයන්හීදි | කේ.ඒ.එන්. රත්නායක මයා (රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 7 | ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උසස් ජීවන තත්ත්වයක් කරා රැගෙනයාමේ පෙර සූදානම | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 2011/11/28 හා 2011/11/29 දිනයන්හීදි | එම්.ඒ.එම්.බී.එස්. ප්‍රනාන්දු මෙනවිය (රාජ්‍ය කළමනාකරණ සහකාර) |

### මහජන බැංකු ආධාර මගින් සිදුකරනු ලැබූ පුහුණු වැඩසටහන්

| | පුහුණු වැඩසටහන | කාලසීමාව | සහභාගි වූ පිරිස |
|---|---|---|---|
| 1 | සමුපකාර සමිතිවල අයවැය ඇස්තමේන්තු හා සංවර්ධන සැලැස්ම සැකසීම පිළිබඳ වැඩමුළුව | 2011-01-27 | දෙපාර්තමේන්තු නිලධාරින් සමිති නිලධාරින් |
| 2 | උසාවි රාජකාරි පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව | 2011-03-04 | දෙපාර්තමේන්තු නිලධාරින් පළාත් දෙපාර්තමේන්තු නිලධාරින් (බස්නාහිර, දකුණ,වයඹ) |
| 3 | රාජ්‍ය ගිණුම්කාරක සභාවේ මතුවූ ගැටළු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව | 2011-03-09 | දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරින් |
| 4 | සංඛ්‍යාලේඛන නිලධාරින් දැනුවත් කිරීමේ වැඩමුළුව | 2011-03-22 | පළාත් හා දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛන නිලධාරින් දෙපාර්තමේන්තු නිලධාරින් |
| 5 | 46(1) පරීක්ෂණය පිළිබඳ නිලධාරින් දැනුවත් කිරීමේ වැඩමුළුව | 2011-04-08 | දෙපාර්තමේන්තු නිලධාරින් |
| 6 | සමුපකාර සමිති සතු ක්‍රියාකාරි හා අක්‍රිය වත්කම් හදුනා ගැනීම, කපාහැරීම හා ප්‍රත්‍යාගණනය කිරීම පිළිබඳ වැඩමුළුව | 2011-04-28<br>2011-04-29 | දෙපාර්තමේන්තු නිලධාරින් සමුපකාර සමිති නිලධාරින් |
| 7 | කාර්යාල ක්‍රම පිළිබඳ වැඩමුළුව | 2011-07-29 | දෙපාර්තමේන්තු නිලධාරින් |
| 8 | ජාත්‍යන්තර සමුපකාර දින උත්සවය පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය කිරීමේ වැඩසටහන | 2011-05-28 | ගරු පළාත් සමුපකාර අමාත්‍යවරුන්, සමුපකාර අමාත්‍යාංශ ලේකම්වරුන් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරුන් |
| 9 | කාර්යසාධන ප්‍රවර්ධන ක්ෂේත්‍ර පුහුණු වැඩමුළුව | 2011-08-26<br>2011-08-27<br>2011-08-28 | දෙපාර්තමේන්තු නිලධාරින් |
| 10 | විගණන සංවර්ධන පුහුණු වැඩමුළුව | 2011-09-02 | දෙපාර්තමේන්තු නිලධාරින් |
| 11 | විගණන සංවර්ධන පුහුණු වැඩමුළුව | 2011-09-15 | දෙපාර්තමේන්තු නිලධාරින් |
| 12 | ආයතන සංග්‍රහය සහ කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන | 2011-09-29 | රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් දෙපාර්තමේන්තු මාණ්ඩලික නිලධාරින් |
| 13 | ගිණුම්කරණ ප්‍රමිත භාවිත කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 2011-10-04 | සමුපකාර සමිති හා සංගම් නිලධාරින් |
| 14 | ගිණුම්කරණ ප්‍රමිත භාවිත කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 2011-10-14 | සමුපකාර සමිති හා සංගම්වල කාර්යමණ්ඩලය |
| 15 | ගිණුම්කරණ ප්‍රමිත භාවිත කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 2011-11-15 | දෙපාර්තමේන්තු නිලධාරින් |
| 16 | රාජ්‍ය ආයතනවල මූල්‍ය පාලනය පිළිබඳ පුහුණු වැඩමුළුව | 2011-11-24<br>2011-11-29 | දෙපාර්තමේන්තු නිලධාරින් |
| 17 | සමුපකාර සමිති වල කාර්යමණ්ඩල සේවක අභිප්‍රේරණ වැඩසටහන | 2011-12-29 | සමුපකාර සමිතිවල කාර්යමණ්ඩල සේවකයින් |

## 1.4.2 විදේශීය පුහුණු

2011 වර්ෂය තුළ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයන් පහත සඳහන් පරිදි විදේශීය අධ්‍යාපන හා පුහුණු පාඨමාලාවන්ට සහභාගි කරවා ඇත.

| | වැඩසටහන | කාලපරිච්-<br>-ඡේදය | සහභාගි වූ නිලධාරීන් |
|---|---|---|---|
| 1 | Programme on skills Develop-<br>-ment of Trainers in the area of promotion and financing of self help of group of joint liability groups for financial inclusion of Rural poor (india) | 2011.02.19<br>2011.02.26 | ජේ.එම්.ඩබ්ලිව්.කේ. ජයසුන්දර මිය<br>(ස.ප්‍ර.වි.ස)<br>කේ.එල්.එස්. මල්කාන්ති මිය<br>(ස.ප්‍ර.වි.ස) |
| 2 | Strengthening Management and Business Activities of Agricultural Co-operatives (Japan) | 2011.05.08<br>2011.07.16 | ඩී.ඒ.එස්. සේනාධිර මයා<br>(ස.ප්‍ර.වි.ස) |
| 3 | ගෝලීය පරිසරය තුළ සමුපකාර සංවිධාන කළමනාකරණය කිරීම හා උපාය මාර්ග හඳුනාගැනීම ජාත්‍යන්තර පුහුණු වැඩසටහන (ඉන්දියාව) | 2011.07.05<br>2011.07.11 | පී.ජී.එම්. මල්කාන්ති මෙනවිය<br>(ස.ප්‍ර.වි.ස)<br>පී.කේ. ගුණරත්න මිය<br>(රාජ්‍ය කළමනාකරණ සහකාර) |
| 4 | Programme on Micro-Finance and woman's Development (India) | 2011.08.29<br>2011.09.01 | එම්.එන්.එල්. පීරිස් මිය<br>(ස.ප්‍ර.වි.ස)<br>එස්.ඒ.ජේ. චන්ද්‍රකුමාර මයා<br>(ස.ප්‍ර.වි.ස) |
| 5 | මැලේසියානු ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව (මැලේසියාව) | 2011.09.01<br>2011.10.11 | ඩී.ජී.එම්.ඩී. පෙරේරා මයා<br>(ගණකාධිකාරී)<br>එම්.බී.එම්. උබේතුංග බණ්ඩාර මයා<br>(ස.සං.දි.නි) |
| 6 | නායකත්ව කළමනාකරණ කුසලතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන (රුසියාව) | 2011.09.21<br>2011.10.01 | පී.එච්. ආනන්ද මයා<br>(ස.සං.කො./රෙ)<br>එම්.ඒ.ජේ.එස්.එම්. අබේනායක මයා<br>(සහකාර කොමසාරිස්) |
| 7 | Trainers Training programme on Agricultural Financing of rural development (Bangladesh) | 2011.10.23<br>2011.10.27 | කේ.ඒ.එස්. නයනප්‍රිය මයා<br>(ස.ප්‍ර.වි.ස)<br>ඒ.ඒ.ඒ.එන්. ආතාවුද මයා<br>(ස.ප්‍ර.වි.ස) |
| 8 | මැලේසියානු හා සිංගප්පූරුවේ සමු.ආයතන පිළිබඳ අධ්‍යයන චාරිකාව (මැලේසියාව සහ සිංගප්පූරුව) | 2011.11.25<br>2011.12.01 | සුරම්‍යා ෆොන්සේකා මිය<br>(සහකාර කොමසාරිස්) |
| 9 | Nedec Assembly (Thailand) | 2011.11.27<br>2011.12.03 | ජේ.එම්.එස්. බණ්ඩාර මයා<br>(සහකාර කොමසාරිස්) |

# 2 පරිච්ඡේදය

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවර්ධන ක්‍රියාකාරකම්

### 2.1 වර්ෂය තුල ක්‍රියාත්මක සමුපකාර සමිති/සංගම් ලියාපදිංචි කිරීම් හා ඈවර කිරීම්

**වර්ෂය තුල ලියාපදිංචි කළ නව සමුපකාර සමිති/ සංගම්**

- ❖ සී/ස වරාය නැව්සේවා සමුපකාර සමිතිය
- ❖ සී/ස යහජීවන සමුපකාර සමිතිය
- ❖ සී/ස සමස්ත ලංකා මාධ්‍යවේදින්ගේ සකසුරුවම් හා සුභසාධක සමුපකාර සමිතිය
- ❖ සී/ස නිවාස හා දේපල සංවර්ධන සමුපකාර සමිතිය
- ❖ සී/ස රජරට විශ්ව විද්‍යාලයීය සමුපකාර සමිතිය

වර්ෂය තුල සමිති / සංගම් ඈවර කිරීමට කටයුතු කර නැත.

### 2.2 සමුපකාර සමිති වල අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම


2011 වර්ෂය තුලදී පහත සඳහන් සමුපකාර සමිති වල අතුරු ව්‍යවස්ථා සංශෝධනයන් අනුමත කර ඇත.

1. සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය
2. සී/ස තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තු සේවක ස.ණ.ස. සමිතිය
3. සී/ස රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සේවකයින්ගේ ස.ණ.ස. සමිතිය
4. සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථායීය ස.ණ.ස. සමිතිය
5. සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සමුපකාර බැංකුව
6. සී/ස සමස්ථ ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ධාන්‍ය සැකසුම්කරුවන්ගේ ව්‍යවසායකත්ව සංවර්ධන සමුපකාර සමිතිය
7. සී/ස සමස්ථ ලංකා අභ්‍යාස පොත් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය.
8. සී/ස ලංගම සේවක ස.ණ.ස. සමිතිය
9. සී/ස ශ්‍රී ලංකා මුද්‍රණ ශිල්පීන්ගේ සමුපකාර සමිතිය
10. සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සුභසාධක සමුපකාර සමිතිය
11. සී/ස බ්‍රවුන් හවුලේ කාර්මික හා පොදු සේවා සමුපකාර ස.ණ.ස. සමිතිය

## 2.3 සමුපකාර සමිති වල ව්‍යවස්ථාපිත විගණන කටයුතු

මෙම දෙපාර්තමේන්තුවෙහි ව්‍යවස්ථාපිත වගකීම් යටතේ විගණනය කළයුතු ප්‍රාථමික සමුපකාර සමිති සහ ජාතික මට්ටමේ සමුපකාර සමිති/සංගම්වල 2007 සිට 2011 වර්ෂය දක්වා විගණන සැලසුම් සහ නිත්‍ය ප්‍රතිඵල පහත දැක්වේ.

| වර්ෂය | සැලසුම් කල විගණන | නිම කල විගණන | වර්ෂය තුල නිමකළ විගණනයන්හි ප්‍රතිශතය |
|---|---|---|---|
| 2007 | 65 | 56 | 86% |
| 2008 | 56 | 51 | 91% |
| 2009 | 55 | 45 | 82% |
| 2010 | 58 | 53 | 91% |
| 2011 | 66 | 64 | 97% |




## 2.4 නීති කටයුතු

නීති කටයුතු වලට අදාළ ප්‍රධාන කාර්යයන් පහත පරිදි සංක්ෂිප්ත කර දැක්විය හැකිය.

- සමුපකාර සමිති වලට සම්බන්ධ නීති රීති හා ව්‍යවස්ථා සම්බන්ධයෙන් අර්ථකතනයන් ඉදිරිපත් කිරීම හා පළාත් කොමසාරිස්වරුන් විසින් ඉදිරිපත් කරන නෛතික ගැටළු පිළිබඳ අවශ්‍ය සහාය ලබාදීම
- ආදර්ශ අතුරු ව්‍යවස්ථා සකස් කිරීම හා සකස් කරන ලද අතුරු ව්‍යවස්ථා අධ්‍යයනය කිරීම
- සමුපකාර සමිති පනතේ 58 වගන්තිය යටතේ සමුපකාර සමිති/සංගම් වලින් ඉදිරිපත් වන තීරක ආරවුල් විභාග කිරීම, ප්‍රදානයන් ලබා දීම, අභියාචනා විභාග කිරීම හා උසාවි බලගැන්වීම

- සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන් වගඋත්තරකරුවන් කරමින් දිස්ත්‍රික් උසාවි, අභියාචනාධිකරණ සහ ශ්‍රේෂ්ඨාධිකරණ වලින් ඉදිරිපත් කරන නඩු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ලබාගෙන අවශ්‍ය කටයුතු කිරීම

## 2.4.1 2011 වර්ෂය තුළ සමුපකාර සමිති/සංගම් වල ආරවුල් බේරුම් කිරීම හා තීරක ප්‍රදානයන් බලගැන්වීම

| | |
|---|---|
| 2011 වර්ෂය තුල බේරුම් කර ඇති ආරවුල් සංඛ්‍යාව | 547 |
| 2011 වර්ෂය තුල උසාවි බලගන්වා ඇති ප්‍රදාන සංඛ්‍යාව | 1,141 |
| උසාවි බලගන්වා ඇති ප්‍රදානයන්හී වටිනාකම රු.මි | 35.14 |

## 2.4.2 2011 වර්ෂය තුළ ලබාදුන් නඩු තීන්දු

| නඩු අංකය | | පාර්ශවකාර සමිතිය |
|---|---|---|
| 102/2010 | - | සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තු ස.ණ.ස. සමිතිය |
| 03/2010 | - | සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තු ස.ණ.ස. සමිතිය |
| 25/2010 | - | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ ස.ණ.ස. සමිතිය |
| 224/2011 | - | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ ස.ණ.ස. සමිතිය |

## 2.4.3 සමුපකාර සමිති/ සංගම් පිළිබඳ පරීක්ෂණ

සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ ස.ණ.ස. සමිතිය පිළිබඳ 2011 වසර තුළ 46 (1) පරීක්ෂණයක් ආරම්භ කළ අතර ඊට අමතරව සමිති වලින් සහ විවිධ පාර්ශවයන් වෙතින් ලැබෙන නාමික හා නිර්නාමික පෙත්සම් විභාග හා පරීක්ෂණ පැවැත්වීම සිදු කරන ලදී.

## 2.5 අරමුදල් කළමනාකරණය

1972 අංක 05 දරණ සමුපකාර පනතේ 43 (1) (ආ) වගන්තිය සහ 57 (3) වගන්තිය යටතේ පිහිටුවන ලද පහත සඳහන් අරමුදල් මෙම වර්ෂය තුළදී ද සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා භාරයේ පැවති අතර, එම අරමුදලේ දායක මුදල් අයකර ගැනීම මෙන්ම වියදම් දැරීම, ආයෝජන, ණය හා ආධාර සැපයීම යන කාර්යයන් ගරු අමාත්‍යතුමාගේ අධීක්ෂණය හා විධානයට යටත්ව අමාත්‍යාංශ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් අරමුදල් කමිටුවේ තීරණ අනුව කළමනාකරණය කරනු ලැබේ.

- සමුපකාර සංවර්ධන අරමුදල
- සමුපකාර සංවර්ධන අතිරික්ත අරමුදල

## 2.5.1 සමුපකාර සංවර්ධන අරමුදල

සමුපකාර සමිති ආඥා පනතේ (107 වැනි අධිකාරිය) 46 වගන්තිය යටතේ පනවා ඇති අංක 10086 සහ 1950.03.24 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පලකරන ලද නියෝග මාලාව යටතේ පිහිටුවා ඇති මෙම අරමුදල ගරු අමාත්‍යතුමාගේ විධානයන්ට යටත්ව සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයා විසින් කළමණාකරනය කරනු ලබයි.

මධ්‍යම රජයේ මෙම අරමුදලට දායකත්වය දරනු ලබන්නේ මෙම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට යටත්වන සමුපකාර සංගම් හා දීප ව්‍යාප්ත සමුපකාර සමිති මගිනි. 2011 වර්ෂය තුළදී එම සමිති වලින් මෙම අරමුදල සඳහා ලැබී ඇති සමිති දායකත්වය රු. මි. 12.95 කි.

**මෙම වර්ෂයේදී සමුපකාර සංවර්ධන අරමුදලින් මූල්‍ය දායකත්වය ලබා දී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පිළිබඳ විස්තර පහතින් දක්වා ඇත.**

- ජාත්‍යන්තර සමුපකාර දින උත්සවය සැමරීම හා සමුපකාර ව්‍යාපාරයට අවුරුදු 100 ක් පිරීම නිමිත්තෙන් "ඉසුරු සවිය" සමුපකාර සැමරුම් උත්සවය පැවැත්වීම.
- "දැයට කිරුළ" වෙළඳ හා අධ්‍යාපන ප්‍රදර්ශනය සඳහා වියදම් දැරීම
- "දැයට කිරුළ" වෙළඳ හා අධ්‍යාපන ප්‍රදර්ශනයට සමගාමීව මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි තෝරාගත් පාසල් දෙකක ළමුන්ගේ පෝෂණය නගාසිටුවීම සඳහා නැවුම් එළකිරි වීදුරුවක් ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- දේශීය පුහුණු වැඩසටහන් සඳහා වැය දැරීම
- විදේශීය පුහුණු වැඩසටහන් සඳහා වැය දැරීම
- මෙගා කෝප්සිටි පිහිටුවීම සඳහා වැය දැරීම
- සිංහල හා හින්දු අලුත් අවුරුදු සමයේ සිදුකරන ලද මෙගා කෝප්සිටි ප්‍රචාරණ වැඩසටහන සඳහා වැය දැරීම

## 2.5.2 සමුපකාර සංවර්ධන අතිරික්ත අරමුදල

මෙම අරමුදලින් වර්ෂය තුළ දී දිවයිනේ පිහිටි සමුපකාර සමිතිවල කටයුතු වැඩි දියුණු කිරීම සඳහා සහන පොලී ප්‍රතිශතයක් යටතේ පහත සඳහන් පරිදි මූල්‍ය ප්‍රතිපාදන ලබා දී ඇත.

තවද රජයේ වී මිලදී ගැනීමේ ප්‍රතිපත්තිය යටතේ නිෂ්පාදන මිලදී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලයට ද සහන පොලී ප්‍රතිශතයක් යටතේ ණය ලබා දී ඇත.

| | සමිතියේ නම | ණය මුදල රු.මි. | ලබා දුන් කාරණය |
|---|---|---|---|
| 1 | සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය | 89 | කාන්තන්කුඩිය, රත්ගම, බුත්තල, යන ප්‍රදේශවල පාරිභෝගික ජනතාව සඳහා පහසු මිලට භාණ්ඩ හා සේවා සැපයීමට සුපිරි වෙළඳසැල් ආරම්භ කිරීම සඳහා හා අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමේ කටයුතු සඳහා |
| 2 | සී/ස බිංගිරිය මැතිවරණ කොට්ඨාශයේ සත්ව නිෂ්පාදන හා කර්මාන්ත සමුපකාර සමිතිය | 6.8 | සිංහල හා හින්දු අලුත් අවුරුදු සමය හා නත්තල් උත්සව සමයේ දී හිඟයකින් තොරව පාරිභෝගික ජනතාවට සත්ත්ව නිෂ්පාදන සැපයීම සඳහා |
| 3 | සී/ස දුම්රිය ස්ථානාධිපති ලිපිකරු ස.ණ.ස. සමිතිය | 10 | සාමාජිකයින්ගේ ණය අවශ්‍යතාව සපුරාලීම සඳහා |
| 4 | සී/ස අභ්‍යාස පොත් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | 8.7 | සමිතියේ නිෂ්පාදන කටයුතු දිරිගැන්වීම හා සමිතිය මුහුණ පා සිටි මූල්‍ය අපහසුතා මඟහරවා ගැනීම සඳහා |
| 5 | වී අලෙවි මණ්ඩලය | 221 | දේශීය වී ගොවියාගේ නිෂ්පාදන මිලදී ගැනීම සඳහා |
| 6 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය | 0.5 | සමිතියේ නිෂ්පාදන කටයුතු දිරිගැන්වීම හා සමිතිය මුහුණ පා සිටි මූල්‍ය අපහසුතා මඟහරවා ගැනීම සඳහා |
| 7 | සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තු ස.ණ.ස. සමිතිය | 30 | සමාජිකයන්ගේ ණය අවශ්‍යතා සපුරාලීම සඳහා |
| 8 | සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 15 | 2011 දැයට කිරුළ වැඩසටහන යටතේ අනුරාධපුර දිස්ත්‍රික් සමුපකාර රෝහල සහ විලච්චිය වී මෝල ඉදිකිරීම සඳහා මූලධන ප්‍රතිපාදන ලැබෙනතෙක් සමුපකාර තොග වෙළඳ සංස්ථාවට ලබා දුන් මුදලකි. |

## 2006 සිට 2011 දක්වා ණය ලබා දීම හා ණය අයවීම

| වර්ෂයට | ණය ලබා දීම රු.මි | අයවීම රු.මි |
|---|---|---|
| 2006 | 56.6 | 1.30 |
| 2007 | 12.5 | 15.08 |
| 2008 | 26.0 | 12.65 |
| 2009 | 31.5 | 33.19 |
| 2010 | 38.0 | 58.77 |
| 2011 | 381.0 | 286.90 |

### වත්කම් හා වගකීම් වාර්තාව (රු.මි)

| විස්තරය | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | |
| ස්ථාවර වත්කම් | - | - | 1.90 | 2.03 | 2.19 | 3.65 |
| ජංගම නොවන වත්කම් | 578.25 | 688.42 | 772.41 | 931.82 | 1042.09 | 902.14 |
| **ජංගම වත්කම්** | | | | | | |
| විවිධ ණය ගැතියෝ | 221.85 | 355.53 | 439.00 | 370.36 | 374.57 | 507.40 |
| වෙනත් ජංගම වත්කම් | 10.64 | 8.53 | 12.84 | 26.10 | 10.50 | 85.52 |
| **උප එකතුව** | 810.74 | 1,052.48 | 1,226.15 | 1,330.31 | 1,429.35 | 1,498.71 |
| **වගකීම්** | | | | | | |
| සම්චිත අරමුදල | 803.90 | 1,045.64 | 1,208.31 | 1,313.51 | 1,412.53 | 1,476.30 |
| වෙනත් වගකීම් | 6.84 | 6.84 | 17.84 | 16.80 | 16.82 | 22.41 |
| උපඑකතුව | 810.74 | 1,052.48 | 1,226.15 | 1,330.31 | 1429.35 | 1,498.71 |

### ආදායම් හා වියදම් වාර්තාව (රු.මි)

| විස්තරය | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|
| **ආදායම** | | | | | | |
| පොළී | 95.96 | 100.56 | 142.80 | 108.52 | 96.40 | 81.12 |
| වෙනත් ආදායම් | 4.36 | - | - | - | - | - |
| **වියදම්** | 0.01 | 2.46 | 1.75 | 2.68 | 6.68 | 13.17 |
| ශුද්ධ ආදායම් අතිරික්තය | 100.31 | 98.1 | 141.05 | 105.84 | 89.72 | 67.95 |

### සමුපකාර සංවර්ධන අතිරික්ත අරමුදලේ වර්ෂ 5 ක වත්කම් හා ආදායම් තත්ත්වය

| වර්ෂය | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|
| වත්කම් | 810.74 | 1,052.48 | 1,226.15 | 1,330.31 | 1,429.35 | 1,498.71 |
| ආදායම | 100.31 | 98.10 | 141.05 | 105.84 | 89.72 | 67.95 |

## 2.6 සංවර්ධන කටයුතු

දෙපාර්තමේන්තුව මගින් ඉටු කළ සංවර්ධන කටයුතු පහත සඳහන් පරිදි වේ.

| | සංවර්ධන ව්‍යාපෘතිය | ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ | රජයේ මුදල් ප්‍රතිපාදන රු.මි | අතිරික්ත අරමුදල් ප්‍රතිපාදන රු.මි. | සමුපකාර සංවර්ධන අරමුදල් ප්‍රතිපාදන රු.මි. |
|---|---|---|---|---|---|
| 1 | "දැයට කිරුළ" වෙළඳ හා අධ්‍යාපන ප්‍රදර්ශනය | සමුපකාර ක්ෂේත්‍රය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම හා ඒ වෙත ජනතාව යොමු කරගැනීම | | | 1.003 |
| 2 | පාසල් ළමුන් අතර දියර කිරි ලබාදීමේ ව්‍යාපෘතිය | පාසල් ළමුන් අතර කිරිපිටි භාවිතය අඩු කර පෝෂණ ගුණයෙන් යුතු දියර කිරි භාවිතයට හුරු කිරීම. දේශීය කිරි ගොවියාගේ කිරි සාධාරණ මිල ගණන් යටතේ ලබා ගනිමින් ඔවුන් ආරක්ෂා කර ගැනීම | | | 1.430 |
| 3 | දිවයින පුරා උප කොමසාරිස් කොට්ඨාශ මට්ටමින් මෙගා කෝප්සිටි සුපිරි වෙළඳසැල් 27 ක් ආරම්භකිරීමේ ව්‍යාපෘතිය (මෙම වසරේ සුපිරි වෙළඳසැල් 2ක් ආරම්භ කරන ලදී) | ජනතාවට සහන මිලට භාණ්ඩ සැපයීම සඳහා | මහජන බැංකු ණය | | 4.980 |
| 4 | සත්ත්ව නිෂ්පාදන ව්‍යාපෘතිය | කුකුළන් ඇති කිරීමේ ව්‍යාපෘතිය මගින් නිෂ්පාදන, පාරිභෝගික ජනතාවට හිඟයකින් තොරව සැපයීමට හැකිවීම | | 6.8 | |
| 5 | විශ්ව විද්‍යාල සමුපකාර සමිති පිහිටුවීම (වයඹ, රජරට හා යාපනය විශ්ව විද්‍යාල සමුපකාර සමිති තුළ සුළු පරිමාණ ණය යෝජනා ක්‍රම ආරම්භ කර ඇත.) | විශ්ව විද්‍යාල ප්‍රජාව තුල සමුපකාර ව්‍යාපාරය පිළිබඳ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කිරීම හා සමුපකාර ව්‍යාපාරය තුලට උගතුන් ප්‍රවේශ කර ගැනීම | 2.0 | | |
| 6 | වාර්ෂික සංඛ්‍යා ලේඛන වාර්තාව සහ පාලන වාර්තාව සකස් කිරීම | සමුපකාර ව්‍යාපාරයේ කළමනාකරණ තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු හා දත්ත උපයෝගි කර ගැනීමට හැකිවීම | 0.2 | | |
| 7 | ගංවතුරින් අනාථ වූවන් සඳහා සහනාධාර ලබාදීම | සමාජ සත්කාර කටයුතු ලෙස ක්‍රියාත්මක කරඇත. | | | 8.4 |

| | සංවර්ධන ව්‍යාපෘතිය | ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ | රජයේ මුදල් ප්‍රතිපාදන රු.මි | අතිරික්ත අරමුදල් ප්‍රතිපාදන රු.මි. | සමුපකාර සංවර්ධන අරමුදල් ප්‍රතිපාදන රු.මි. |
|---|---|---|---|---|---|
| 8 | කෝප්නෙට් ව්‍යාපෘතිය | තොරතුරු සන්නිවේදන භාවිතය මගින් සමුපකාර අංශයේ කළමනාකරණ තීරණ ගැනීමට අවශ්‍ය පසුබිම සැකසීම | | 0.49 | |
| 9 | සමූපදීපනි පුවත්පත මුද්‍රණය කිරීම | දිණමිණ පුවත්පතේ මාසික අතිරේකයක් පළ කිරීම තුළින් සමුපකාර ව්‍යාපාරය ජනතාව තුළ ප්‍රචලිත කිරීම | 6.00 | 0.35 | |
| 10 | ඒකාබද්ධ අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමේ වැඩසටහන (චක්‍රීය අරමුදල) | සමුපකාර අලෙවි ජාලය තුළින් පාරිභෝගික ප්‍රජාවට සහන මිලකට භාණ්ඩ ලබා ගැනීමට හැකිවීම | 807.50 | | 1.11 |
| 11 | පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | සමුපකාර දෙපාර්තමේන්තු නිලධාරින්, සමුපකාර සමිති අධ්‍යක්ෂ මණ්ඩල සහ කාර්යමණ්ඩල වල දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම | 0.15 | | 0.04 |
| 12 | පාසල් සමුපකාර සමිති පිහිටුවීම හා ප්‍රතිසංවිධානය කිරීම | ශිෂ්‍ය ප්‍රජාවගේ සමුපකාරය පිළිබඳ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කිරීම | 3.80 | | |

# 3 පරිච්ඡේදය

## ජාතික මට්ටමේ සමුපකාර සංවිධාන

වර්ෂය තුල පහත සඳහන් මුදුන් මට්ටමේ සමුපකාර සංගම්වල සංවර්ධන හා ව්‍යවසාය කටයුතු මෙන්ම ඒවායෙහි අධීක්ෂණ කටයුතු ද දෙපාර්තමේන්තුව මගින් ඉටුකරන ලදී.

1. සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය
2. සී/ස ශ්‍රී ලංකා සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිති මහා සංගමය (ස.ණ.ස)
3. සී/ස ශ්‍රී ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු මහා සංගමය
4. සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය (කෝප්ෆෙඩ්)
5. සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය (මාක්ෆෙඩ්)
6. සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය (සියෙස්ටා)
7. සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය
8. සී/ස ශ්‍රී ලංකා සමුපකාර පේෂ කර්මාන්ත සංගමය (කෝප් ටෙක්ස්)
9. සී/ස ශ්‍රී ලංකා කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති මහා සංගමය
10. සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමය (නිස්කෝ)
11. සී/ස ශ්‍රී ලංකා ජාතික ධීවර සමුපකාර සමිති මහා සංගමය
12. සී/ස ශ්‍රී ලංකා සකසුරුවම් හා ණය ගනුදෙනු සමිති සම්පත් කළමණාකරණ සමුපකාර සන්ධානය
13. සී/ස ශ්‍රී ලංකා තේ නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති මහා සංගමය
14. සී/ස ශ්‍රී ලංකා ආරෝග්‍යශාලා සේවා සමුපකාර සමිති මහා සංගමය

(මෙම සමිති වල සාමාජික සංඛ්‍යා හා සේවක සංඛ්‍යා පිළිබඳ තොරතුරු වාර්තාවේ අංක 02 දරණ උපලේඛණයේ දක්වා ඇත.)

## 01. සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය

| | | |
|---|---|---|
| ලියාපදිංචි අංකය | : | කො.2490 |
| ලියාපදිංචි දිනය | : | 1972/07/26 |

මෙම සංගමය, ශ්‍රී ලංකාවේ සියළුම වර්ගයේ සමුපකාර සමිති අතර ජාතික මට්ටමේ අග්‍රස්ථ සමුපකාර සංවිධානය ලෙස සලකනු ලැබේ. ජාතික හා අන්තර්ජාතික මට්ටමේ දී ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය නියෝජනය කරන ස්වාධීන සංවිධානයක් ලෙස මෙම ආයතනය කටයුතු කරයි. ජාත්‍යන්තර සමුපකාර සංවිධානයෙහි ප්‍රථම ආසියානු කලාපීය සාමාජිකයා ලෙස මෙම ආයතනය හැඳින්විය හැකිය.

ව්‍යාපාරික හා සේවා අංශ :

- ආයතන හා පරිපාලන අංශ
- අධ්‍යාපන අංශය
- විදේශ අංශය
- බැංකු අංශය
- ගෘහ නිර්මාණ ශිල්පීය අංශය
- ව්‍යාපෘති අංශය
- ප්‍රකාශන අංශය
- ප්‍රවාහන අංශය
- අනුරාධපුර නිවාඩු නිකේතනය

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 41 |
| සේවක සංඛ්‍යාව | | 59 |
| 2011.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 705.16 |

## 02. සී/ස ශ්‍රී ලංකා සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිති මහා සංගමය (ස.ණ.ස)

| | | |
|---|---|---|
| ලියාපදිංචි අංකය | : | කො. 2651 |
| ලියාපදිංචි දිනය | : | 1980/11/10 |

ශ්‍රී ලංකා සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති මහා සංගමය දිවයින පුරා ව්‍යාප්තව ඇත්තේ ස.ණ.ස. යන කෙටිනාමයෙනි. මෙය සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති වල ජාතික මට්ටමේ අග්‍රස්ථ සමුපකාර සංවිධානය ලෙස සලකනු ලැබේ.

ව්‍යාපාරික හා සේවා අංශ :

- ලිපි ද්‍රව්‍ය අංශය
- ප්‍රකාශන අංශය

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 432 |
| සේවක සංඛ්‍යාව | | 18 |
| 2011.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 69.27 |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය | රු.මි. | 2.03 |

## 03. සී/ස ශ්‍රී ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු මහා සංගමය

ලියාපදිංචි අංකය : සමු. 17

ලියාපදිංචි දිනය : 1997/12/15

මෙම සංගමය ආරම්භ වී ඇත්තේ දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම් මගින් ප්‍රාථමික මට්ටමේ ග්‍රාමීය බැංකු කටයුතු සංවර්ධනය කිරීමේ අරමුණින් වන අතර, සංගමයෙහි කාර්යය වනුයේ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමයි.

ව්‍යාපාරික හා සේවා අංශ :

- නියෝජිත සේවා අංශය
- අධ්‍යාපන අංශය
- ඉකස් හා ඉතුරුම් මධ්‍යස්ථානය
- මූල්‍ය අංශය

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 13 |
| සේවක සංඛ්‍යාව | | 14 |
| 2011.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 1,448.19 |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය | රු.මි. | 3.80 |

## 04. සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය (කෝප්ෆෙඩ්)

ලියාපදිංචි අංකය : සමු. 241
ලියාපදිංචි දිනය : 1989.09.15

මෙම සංගමය මූලික වශයෙන් ශ්‍රී ලංකාවේ පාරිභෝගික කටයුතු වල නිරත සමුපකාර සමිතිවල කටයුතු පහසු කරවීම සහ ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ඇත.

ව්‍යාපාරික හා සේවා අංශ

- සිල්ලර අංශය
- තොග වෙළඳ අංශය
- ගුවන් ටිකට්පත් අලෙවි අංශය
- සේවක පුහුණු අංශය
- නියෝජිත අංශය

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 237 |
| සේවක සංඛ්‍යාව | | 162 |
| 2011.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 425.52 |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය | රු.මි. | 32.98 |

## 05. සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය (මාක්ෆෙඩ්)

| | | |
|---|---|---|
| ලියාපදිංචි අංකය | : | කො.2504 |
| ලියාපදිංචි දිනය | : | 1973.03.01 |

මෙම සංගමය ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම අංශයෙහි ක්‍රියාත්මක වන සමුපකාර සමිතිවල නිෂ්පාදන මිලදී ගැනීමේ හා අලෙවි කිරීමේ කටයුතු වල නියැලෙන ජාතික මට්ටමේ සමුපකාර සංගමයක් ලෙස සලකනු ලැබේ. මීට අමතරව පාරිභෝගික භාණ්ඩ ආනයනය කර සමුපකාර සමිති වලට අලෙවි කිරීමේ කාර්යයද කරනු ලැබේ.

ව්‍යාපාරික හා සේවා අංශ

- අලෙවි අංශය
- ඉන්ධන අංශය
- තලාව සහල් සැකසුම් අංශය
- ප්‍රවාහන අංශය
- කෘෂි අංශය
- ආනයනික ද්‍රව්‍ය අංශය

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 153 |
| සේවක සංඛ්‍යාව | | 102 |
| 2011.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 582.5 |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය | රු.මි. | 9.1 |

## 06. සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය (සියෙස්ටා)

| | | |
|---|---|---|
| ලියාපදිංචි අංකය | : | කො. 2527 |
| ලියාපදිංචි දිනය | : | 1974.03.19 |

මෙම සංගමය ශ්‍රී ලංකාවේ කාර්මික අංශයෙහි ක්‍රියාත්මක වන සමුපකාර සමිතිවල ජාතික මට්ටමේ සමුපකාර සමිතියක් ලෙස සලකනු ලැබේ.

ව්‍යාපාරික හා සේවා අංශ

- රබර් මිශ්‍රිත කොහු මෙට්ට නිෂ්පාදන අංශය
- දඟර කොහු නිෂ්පාදන අංශය

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 186 |
| සේවක සංඛ්‍යාව | | 41 |
| 2011.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 43.50 |
| වර්ෂයේ ශුද්ධ ඌණතාවය | රු.මි. | 10.39 |

## 07. සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය

| | | |
|---|---|---|
| ලියාපදිංචි අංකය | : | කො. 1086 |
| ලියාපදිංචි දිනය | : | 1942.04.01 |

මෙම සංගමයෙහි ප්‍රධාන අරමුණ පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි නිරත සමුපකාර සමිතිවල කටයුතු ප්‍රවර්ධනය කිරීම වේ. නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය උපදේශන සේවා සැපයීම, යෙදවුම් හා වෙනත් සේවාවන් ලබා දීම, නිෂ්පාදන අලෙවිය සඳහා පහසුකම් සැලසීම ඇතුළු අදාළ ක්ෂේත්‍රයන්හී සියලුම අංශවල සංවර්ධනය සඳහා පහසුකම් සැපයීම වේ.

ව්‍යාපාරික හා සේවා අංශ

- පොල්තෙල් නිෂ්පාදන අංශය
- පොල්තෙල් බෝතල් අංශය
- සබන් නිෂ්පාදන අංශය
- සිල්ලර වෙළඳසැල් අංශය
- පොදු අපනයන තැරැව් අංශය
- කිරි නිෂ්පාදන අලෙවිහල

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 08 |
| සේවක සංඛ්‍යාව | | 25 |
| 2011.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 69.27 |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය | රු.මි. | 2.03 |

## 08. සී/ස ශ්‍රී ලංකා සමුපකාර පේශ කර්මාන්ත සංගමය (කෝප් ටෙක්ස්)

| | | |
|---|---|---|
| ලියාදිංචි අංකය | : | කො.2559 |
| ලියාපදිංචි දිනය | : | 1981.09.02 |

මෙම සංගමයේ අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන මධ්‍යස්ථාන හොරණ ප්‍රදේශයේ මිල්ලෑව සහ මාහේනවත්ත යන ප්‍රදේශ වල පවත්වාගෙන යනු ලබයි. මීට අමතරව සාමාජික සමිති වලට තම නිෂ්පාදන අලෙවි කිරිමේ පහසුකම් සලසා දීම සහ රාජ්‍ය සේවකයින්ට ණය පදනමට නිෂ්පාදන අලෙවි කිරීමේ කටයුතු ද සිදුකරනු ලබයි. වර්ණ ගැන්වීම සහ නවීන මෝස්තර අනුව රෙදිපිළි නිෂ්පාදනය පිළිබඳ වැඩමුළු සංවිධානය කිරීම සංගමය විසින් මෙම වසර තුළ සිදු කර ඇත.

ව්‍යාපාරික හා සේවා අංශ

- නිෂ්පාදන අංශය
- ණය අලෙවි අංශය
- සිල්ලර අංශය
- ජංගම අලෙවි අංශය

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 12 |
| සේවක සංඛ්‍යාව | | 05 |
| 2011.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 22.30 |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය | රු.මි. | 0.38 |

## 09. සී/ස ශ්‍රී ලංකා කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති මහා සංගමය

| | | |
|---|---|---|
| ලියාපදිංචි අංකය | : | සමු.13 |
| ලියාපදිංචි දිනය | : | 1997.05.05 |

මෙම සංගමයෙහි මූලික අරමුණ කිරි නිෂ්පාදනය හා අළෙවි අංශය තුළ සමුපකාර සමිති කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසීමය. මීට අමතරව තම සාමාජික සමිති සඳහා අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම ලබාදීම සිදුකරනු ලබයි.

ව්‍යාපාරික හා සේවා අංශ

- බෙදාහැරීමේ අංශය
- විකුණුම් අංශය
- උපකරණ අංශය

| | |
|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | 17 |
| සේවක සංඛ්‍යාව | 1 |

## 10. සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමය (නිස්කෝ)

| | | |
|---|---|---|
| ලියාපදිංචි අංකය | : | කො.2689 |
| ලියාපදිංචි දිනය | : | 1986.01.01 |

ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ගේ ආර්ථික, අධ්‍යාපනික, සමාජීය, සංස්කෘතික හා ක්‍රීඩාමය අවශ්‍යතා සමුපකාර ප්‍රතිපත්ති අනුව සපුරාලීම මෙහි පරමාර්ථ වේ.

ව්‍යාපාරික හා සේවා අංශ

- මුද්‍රණාල අංශය
- රථවාහන අංශය
- මුද්‍රණ ලිපි ද්‍රව්‍ය අංශය

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 25 |
| සේවක සංඛ්‍යාව | | 10 |
| 2011.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 4.5 |

## 11. සී/ස ශ්‍රී ලංකා ජාතික ධීවර සමුපකාර සමිති මහා සංගමය

| | | |
|---|---|---|
| ලියාපදිංචි අංකය | : | සී.1227 |
| ලියාපදිංචි දිනය | : | 1952.02.02 |

මෙම සංගමය ධීවර සමුපකාර සමිතිවල සංවර්ධනය සඳහා ආරම්භ විය. තම සාමාජිකයින්ගේ ආර්ථික හා සාමාජීය තත්ත්වය උසස් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම, නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීමේ මැදිහත්කරු වශයෙන් ක්‍රියා කිරීම මෙම සංගමය මගින් සලසන ලද සේවාවන් වේ.

ව්‍යාපාරික හා සේවා අංශ

- ණය පහසුකම් හා සේවා අංශය
- ගොඩනැගිලි කළමනාකරණය හා සේවා අංශය
- වාහන නැවතුම් කුලී අංශය

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 58 |
| සේවක සංඛ්‍යාව | | 04 |
| 2011.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 11.07 |
| වර්ෂයේ ශුද්ධ ඌනතාවය | රු.මි. | 0.42 |

## 12. සී/ස ශ්‍රී ලංකා සකසුරුවම් හා ණය ගනුදෙනු සමිති සම්පත් කළමනාකරණ සමුපකාර සංධානය

| | | |
|---|---|---|
| ලියාපදිංචි අංකය | : | සමු. 30 |
| ලියාපදිංචි දිනය | : | 2005.11.21 |

සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සංවිධාන වල මුදුන් මට්ටමේ ආයතනයක් ලෙස සිටිමින් එකී ආයතන වල සාමාජිකත්වයේ ආර්ථික හා සමාජ සංවර්ධන උන්නතිය උදෙසා මූල්‍ය කළමනාකරණ සේවා ප්‍රමුඛ කරගත් උපදේශකයෙකු, නියෝජිතයෙකු, ආරක්ෂකයෙකු, මග පෙන්වන්නෙකු, ලෙස ක්‍රියාකරමින් සමුපකාර සකසුරුවම් හා ණය දෙන සමිති, ජනතා ව්‍යවසායක් ලෙස සංවර්ධනය කිරිම මෙහි මෙහෙවර වේ.

මෙම සංගමය විසින් වාර්ෂිකව ළමා සමාජ, සාහිත්‍ය තරගාවලි පැවැත්වීම, කාන්තා සම්මේලනය හා ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම් ලබාදීම ක්‍රියාත්මක කරන ලදී.

ව්‍යාපාරික හා සේවා අංශ

- මූල්‍ය අංශය
- අධ්‍යාපන සේවා අංශ

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 07 |
| සේවක සංඛ්‍යාව | | 03 |
| 2011.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 19.82 |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය | රු.මි. | 0.40 |

## 13. සී/ස ශ්‍රී ලංකා තේ නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති මහා සංගමය

| | | |
|---|---|---|
| ලියාපදිංචි අංකය | : | සමු.29 |
| ලියාපදිංචි දිනය | : | 2003.10.07 |

සමුපකාර ප්‍රතිපත්ති වලට අනුකූලව මෙම සංගමයේ සාමාජික සමිති හා සංගම් වල ආර්ථික තත්ත්වය හා කාර්ය සාධනය වර්ධනය කිරීමත්, එකිනෙකාගේ සුභසිද්ධිය සඳහා කටයුතු කිරීමත්, මහ සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් සංවර්ධන හා ආර්ථික කටයුතු කිරීමත් ශ්‍රී ලංකාවේ තේ කර්මාන්ත ශාලා පවත්වාගෙන යන සමුපකාර සමිති හා සංගම් ද

විවිධ සේවා සමුපකාර සමිති ද වෙනුවෙන් එහි නියාමකයෙකු ලෙස, ආරක්‍ෂකයෙකු ලෙස , නියෝජිතයෙකු ලෙස, ප්‍රචාරකයෙකු හා ජාතික හා ජාත්‍යන්තර වශයෙන් නියෝජනය කරන්නෙකු ලෙස කටයුතු කිරීමත් මෙහි පරමාර්ථයන් අතර වේ.

ව්‍යාපාරික හා සේවා අංශ

- තේ කුඩු පැකට් කර අලෙවි කිරීමේ අංශය

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 06 |
| සේවක සංඛ්‍යාව | | 01 |
| 2011.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 2.39 |
| වර්ෂයේ ශුද්ධ ඌනතාවය | රු.මි. | 0.30 |

## 14. සී/ස ශ්‍රී ලංකා ආරෝග්‍යශාලා සේවා සමුපකාර සමිති මහා සංගමය

| | |
|---|---|
| ලියාපදිංචි අංකය | සමු. 33 |
| ලියාපදිංචි දිනය | 2007.02.23 |

ශ්‍රී ලංකාවේ මහජනතාව සහ සාමාජිකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම, ප්‍රතිකාර ලබාදීම හා නිරෝගී ජනතාවක් බිහි කිරීම පිණිස සංගමයේ සාමාජික සමුපකාර සමිති වලට අවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීම මහා සංගමයේ පරමාර්ථය වන්නේය. මෙම සංගමය සමුපකාර ප්‍රජාවගේ සෞඛ්‍ය සංවර්ධනය හා පවුල්වල සෞඛ්‍ය ආරක්‍ෂණය සනීපාරක්‍ෂාව පිළිබඳ නිරවුල් අවබෝධය, ඉදිරි රෝගී තත්ත්වයන් පිළිබඳව පෙර සූදානම හා අන්‍යෝන්‍ය සහයෝගයෙන් යුතු ප්‍රජාපාදිත සෞඛ්‍ය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යන කටයුතු වල යෙදේ. මෙම සංගමය විසින් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් හෙද පුහුණුව හා සෞඛ්‍ය සම්බන්ධිත කරුණු පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO), ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) යන ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කරයි.

| | | |
|---|---|---|
| සාමාජික සමිති සංඛ්‍යාව | | 12 |
| සේවක සංඛ්‍යාව | | 02 |
| 2011.12.31 දිනට මුළු වත්කම් හා වගකීම් | රු.මි. | 0.31 |
| වර්ෂයේ ශුද්ධ ඌනතාවය | රු.මි. | 0.02 |

# 4 පරිච්ඡේදය

## දීපව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සමිති

දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට හා මෙහෙයවීමට යටත්ව දීපව්‍යාප්ත ප්‍රාථමික සමුපකාර සමිති 39 ක් 2011 වර්ෂය තුල ක්‍රියාත්මක විය. මෙම සමුපකාර සමිති ප්‍රධාන කාණ්ඩ 02 කට වර්ග කර දැක්විය හැකිය.

4.1. දීපව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති
4.2. දීපව්‍යාප්ත නිෂ්පාදන හා වෙනත් සේවා සමුපකාර සමිති

### 4.1 දීපව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති

මෙහි සමිති ප්‍රධාන වර්ග දෙකකට අයත් වේ.

4.1.1. දීපව්‍යාප්ත ආයතනික සේවක ස.ණ.ස. සමිති
4.1.2. දීපව්‍යාප්ත වෙනත් මූල්‍ය සේවා සමුපකාර සමිති

### 4.1.1 දීපව්‍යාප්ත ආයතනික සේවක ස.ණ.ස සමිති

**මෙම සමුපකාර සමිතිවල මූලික කාර්යයන්**

- සමිතියේ සාමාජිකත්වය හිමි ආයතනික සේවකයන්ගේ ඉතුරුම් රාශිකරණය
- සමාජිකත්වයට ණය පහසුකම් සපයා දීම
- සාමාජික සුභ සාධනයට පියවර ගැනීම. (මරණාධාර, ශිෂ්‍යත්ව ආධාර, වෛද්‍යාධාර, පාරිභෝගික හා වෙනත් අන්‍යෝන්‍යාධාර ක්‍රම වැඩි දියුණු කර පවත්වාගෙන යාම)
- වෙනත් සේවා සැපයීම, (විශ්‍රාම ශාලා/ නිවාඩු නිකේතන / උකස් සේවා/ මුද්‍රණාල පහසුකම්/ රක්ෂණ නියෝජිත සේවා)
- සාමාජිකයින්ගේ ජීවන තත්ත්වය පහසුකරලීමේ ආර්ථික හා සාමාජීය කටයුතු වල යෙදීම

### 4.1.2 දීපව්‍යාප්ත වෙනත් මූල්‍ය සේවා සමුපකාර සමිති

- සී/ස ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සංවර්ධන සේවා සමුපකාර සමිතිය
- සී/ස යහජීවන සමුපකාර සමිතිය
- සී/ස නිවාස හා දේපල සමුපකාර සමිතිය

(මෙම සමිති වල සාමාජික සංඛ්‍යා හා සේවක සංඛ්‍යා මෙම වාර්තාවේ අංක 04 දරණ උපලේඛණයේ දක්වා ඇත.)

## 4.2 දීපව්‍යාප්ත නිෂ්පාදන හා වෙනත් සේවා සමුපකාර සමිති

මෙම කාණ්ඩයට අයත් පහත සඳහන් සමුපකාර සමිති 2011 වර්ෂය තුළ ක්‍රියාත්මක වී ඇත.

- සී/ස සමස්ත ලංකා අභ්‍යාස පොත් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය
- සී/ස ශ්‍රී ලංකා වානේ කර්මාන්ත සමුපකාර සමිතිය
- සී/ ස මුද්‍රණ ශිල්පීන්ගේ සමුපකාර සමිතිය
- සී/ස සමස්ත ලංකා විචිත්‍ර පැලැටි හා උඩවැඩියා වවන්නන්ගේ සමුපකාර සමිතිය
- සී/ස සමස්ත ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ධාන්‍ය සැකසුම්කරුවන්ගේ ව්‍යවසායකත්ව සංවර්ධන සමුපකාර සමිතිය.
- සී/ස බන්ධනාගාර සේවා සැපයුම් සහ ගොඩනැගිලි ඉදිකිරීම් කම්කරු සමුපකාර සමිතිය
- සී/ස ශ්‍රී ලංකා මාදැල් හිමියන්ගේ සමුපකාර සමිතිය

(මෙම සමිති වල සාමාජික සංඛ්‍යා හා සේවක සංඛ්‍යා මෙම වාර්තාවේ අංක 05 දරණ උපලේඛනයේ දක්වා ඇත.)

## 5 පරිච්ඡේදය

### උපලේඛන අංකය 01
### 2011 වර්ෂය සඳහා රජයේ අයවැය මගින් වෙන්කළ
### මූල්‍ය ප්‍රතිපාදන හා වියදම් දැරීම
### පුනරාවර්තන වියදම්

| වැය විෂය අංකය | කාණ්ඩය / වැය විෂයය/ අයිතම විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රු.මි. | 2011.12.31 දිනට මුළු වියදම රු.මි. | 2011.12.31 දිනට ඉතිරිය රු.මි. |
|---|---|---|---|---|
| 1001 | වැටුප් හා වේතන | 21.500 | 17.555 | 3.945 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 0.700 | 0.543 | 0.157 |
| 1003 | වෙනත් දීමනා | 7.250 | 7.221 | 0.029 |
| 1101 | ගමන් වියදම් - දේශීය | 2.100 | 2.052 | 0.048 |
| 1102 | ගමන් වියදම් - විදේශීය | 0.600 | 0.571 | 0.029 |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1.425 | 1.421 | 0.004 |
| 1202 | ඉන්ධන | 1.370 | 1.368 | 0.002 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 0.100 | 0.094 | 0.006 |
| 1301 | වාහන | 1.450 | 1.435 | 0.015 |
| 1302 | යන්ත්‍ර හා උපකරණ | 0.400 | 0.394 | 0.006 |
| 1402 | තැපැල් හා සන්නිවේදනය | 1.280 | 1.276 | 0.004 |
| 1403 | විදුලිය හා ජලය | 1.640 | 1.600 | 0.040 |
| 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 4.330 | 2.936 | 1.394 |
| 1405 | වෙනත් | 1.280 | 1.238 | 0.042 |
| 1505 | සම්මාදම් හා දායක මුදල් | 0.300 | 0.226 | 0.074 |
| 1506 | රජයේ සේවකයන් සඳහා දේපල ණය පොලී | 0.350 | 0.349 | 0.001 |
| | එකතුව | 46.075 | 40.279 | 5.796 |

# මූලධන වියදම්

| වැය විෂය අංකය | කාණ්ඩය / වැය විෂයය/ අයිතම විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රු.මි. | 2011.12.31 දිනට මුළු වියදම රු.මි. | 2011.12.31 දිනට ඉතිරිය රු.මි. |
|---|---|---|---|---|
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 0.150 | 0.108 | 0.042 |
| 2003 | වාහන | 0.500 | 0.486 | 0.014 |
| 2102 | ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 0.100 | 0.098 | 0.002 |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 0.100 | - | 0.100 |
| 2401 | පුහුණු කිරීම් සහ හැකියා වර්ධනය | 0.150 | 0.120 | 0.030 |
| 2502-1 | සමුපකාර ප්‍රචාරණය | 6.000 | 5.977 | 0.023 |
| 2502-2 | විශ්වවිද්‍යාල සමුපකාර සමිති පිහිටුවීම | 2.000 | 2.000 | - |
| 2502-3 | පාලන වාර්තා මුද්‍රණය | 0.200 | 0.170 | 0.030 |
| 2502-4 | පාසල් කිරිහල් 10ක් ආරම්භ කිරීම | 3.800 | 3.800 | - |
| 2502 | සමුපකාර සමිති වල කාරක ප්‍රාග්ධන ඌනතාවයන් මග හැරීම සඳහා වන චක්‍රීය අරමුදලක් පිහිටුවීම | 450.000 | 392.500 | 57.500 |
| | එකතුව | 463.000 | 405.259 | 57.741 |

## පුනරාවර්ථන හා මූලධන ප්‍රතිපාදන සාරාංශය

| | විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රු.මි. | 2011.12.31 දිනට මුළු වියදම රු.මි. | 2011.12.31 දිනට ඉතිරිය රු.මි. |
|---|---|---|---|---|
| 1 | පුනරාවර්තන වියදම් | 46.075 | 40.279 | 5.796 |
| 2 | මූලධන වියදම් | 463.000 | 405.259 | 57.741 |
| | මුළු එකතුව | 509.075 | 445.538 | 63.537 |

උපලේඛන අංක 02

# ජාතික මට්ටමේ සමුපකාර සංගම්

**සාමාජික සංඛ්‍යා හා සේවක සංඛ්‍යා 2011 වර්ෂය**

| සංගමයේ නම | සාමාජික සමිති සංඛ්‍යාව | සේවක සංඛ්‍යාව |
|---|---|---|
| 01. සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය | 41 | 59 |
| 02. සී/ස ශ්‍රී ලංකා සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිති මහා සංගමය | 432 | 18 |
| 03. සී/ස ශ්‍රී ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු මහා සංගමය | 13 | 14 |
| 04. සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය | 237 | 162 |
| 05. සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය | 153 | 102 |
| 06. සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය | 186 | 41 |
| 07. සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | 8 | 25 |
| 08. සී/ස ශ්‍රී ලංකා සමුපකාර පේෂ කර්මාන්ත සංගමය | 12 | 5 |
| 09. සී/ස ශ්‍රී ලංකා කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිති මහා සංගමය | 17 | 1 |
| 10. සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමය | 25 | 10 |
| 11. සී/ස ශ්‍රී ලංකා ජාතික ධීවර සමුපකාර සමිති මහා සංගමය | 58 | 4 |
| 12. සී/ස ශ්‍රී ලංකා සකසුරුවම් හා ණය ගනුදෙනු සමිති සම්පත් කළමනාකරණ සමුපකාර සන්ධානය | 7 | 3 |
| 13. සී/ස ශ්‍රී ලංකා තේ නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති මහා සංගමය | 6 | 1 |
| 14. සී/ස ශ්‍රී ලංකා ආරෝග්‍යශාලා සේවා සමුපකාර සමිති මහා සංගමය | 12 | 2 |
| එකතුව | 1,207 | 447 |

### උපලේඛන අංක 03

## දීප ව්‍යාප්ත ආයතනික මූල්‍ය සේවා සමුපකාර සමිති

### සාමාජික සංඛ්‍යා හා සේවක සංඛ්‍යා 2011 වර්ෂය

| සමිතියේ නම | සාමාජික සංඛ්‍යාව | සේවක සංඛ්‍යාව |
|---|---|---|
| 01. සී/ස අධ්‍යාපන සේවකයන්ගේ ස.ණ.ස සමිතිය | 143,301 | 601 |
| 02. සී/ස තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තු සෙවක ස.ණ.ස. සමිතිය | 12500 | 35 |
| 03. සී/ස දුම්රිය මාර්ග වැඩ හා දෙපාර්තමේන්තු ස.ණ.ස. | 161 | 01 |
| 04. සී/ස දුම්රිය ස්ථානාධිපති හා ලිපිකරු ස.ණ.ස | 1,169 | 04 |
| 05. සී/ස බ්‍රවුන් හවුලේ කාර්මික හා පොදු සේවා ස.ණ.ස. | 295 | 01 |
| 06. සී/ස මහජන බැංකු සේවක ස.ණ.ස. | 5,800 | 07 |
| 07. සී/ස මහජන සෞඛ්‍ය පරීක්ෂවරුන්ගේ ස.ණ.ස. | 889 | 02 |
| 08. සී/ස රාජ්‍ය ඉංජිනේරු සංස්ථා ස.ණ.ස. | 1,576 | 06 |
| 09. සී/ස සතොස සේවක ස.ණ.ස. | 1,849 | 04 |
| 10. සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තු සේවක ස.ණ.ස. | 39,134 | 76 |
| 11. සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීමේ ස.ණ.ස. | 15,146 | 23 |
| 12. සී/ස කොළඹ මහාරෝග්‍යශාලීය සේවක ස.ණ.ස | 3,947 | 10 |
| 13. සී/ස වරාය අධිකාරියේ සේවක සුභසාධක ස.ණ.ස. | 3,821 | 13 |
| 14. සී/ස වරාය අධිකාරියේ සේවක සමුපකාර බැංකුව | 8,029 | 19 |
| 15. සී/ස මැනුම් සහායකවරුන්ගේ ස.ණ.ස. | 1,118 | නැත |
| 16. සී/ස රෙජිස්ට්‍රාර්ජනරාල් දෙපාර්තමේන්තුවේ ස.ණ.ස | 650 | 02 |
| 17. සී/ස වතු සේවක නිවාස ස.ණ.ස. | 3,096 | 01 |
| 18. සී/ස රාජ්‍ය සේවා උපාධිධාරීන්ගේ ස.ණ.ස. | 55 | නැත |
| 19. සී/ස ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලයේ ස.ණ.ස. | 115 | නැත |
| 20. සී/ස දේශීය අදායම් දෙපාර්තමේන්තු සේවක ස.ණ.ස. | 1,116 | 02 |
| 21. සී/ස සමස්ත ලංකා මාධ්‍යවේදීන්ගේ සකසුරුවම් හා සුභසාධක සමිතිය | 20 | නැත |
| 22. සී/ස රජරට විශ්වවිද්‍යාලීය සමුපකාර සමිතිය | 15 | නැත |
| 23. සී/ස රාජ්‍ය සේවා ස.ණ.ස. | 13,510 | 30 |
| 24. සී/ස ලංගම සේවක ණයදෙන සමුපකාර සමිතිය | 4,190 | 10 |
| 25. සී/ස සමෘද්ධි හා කෘෂි පර්යේෂණ නිලධාරීන්ගේ ස.ණ.ස. සමිතිය | 5,866 | 5 |
| 26. සී/ස ශ්‍රී ලංකා වරාය නැව්සේවා සමුපකාර සමිතිය | 62 | නැත |
| 27. සී/ස සණස සංවර්ධන බැංකුවේ සේවක ණයගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 446 | 1 |
| 28. සී/ස සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු ස.ණ.ස. සමිතිය | 17 | නැත |
| 29. සී/ස බන්ධනාගාර දෙපාර්තමේන්තු ස.ණ.ස. | 3,327 | 04 |
| එකතුව | 271,220 | 857 |

### උපලේඛන අංක 04
## දීප ව්‍යාප්ත වෙනත් මූල්‍ය සේවා සමුපකාර සමිති
### සාමාජික සංඛ්‍යා හා සේවක සංඛ්‍යා 2011 වර්ෂය

| සමිතියේ නම | සාමාජික සංඛ්‍යාව | සේවක සංඛ්‍යාව |
|---|---|---|
| 01. සී/ස ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සංවර්ධන සේවා සමුපකාර සමිතිය | 37,536 | 9 |
| 02. සී/ස යහජීවන සමුපකාර සමිතිය | 33 | නැත |
| 03. සී/ස නිවාස හා දේපල සමුපකාර සමිතිය | 14 | නැත |
| | 37,583 | 9 |

### උපලේඛන අංක 05
## දීප ව්‍යාප්ත නිෂ්පාදන හා වෙනත් සේවා සමුපකාර සමිති
### සාමාජික සංඛ්‍යා හා සේවක සංඛ්‍යා 2011 වර්ෂය

| සමිතියේ නම | සාමාජික සංඛ්‍යාව | සේවක සංඛ්‍යාව |
|---|---|---|
| 01 සී/ස සමස්ත ලංකා අභ්‍යාස පොත් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | 53 | 7 |
| 02 සී/ස ශ්‍රී ලංකා වානේ කර්මාන්ත සමුපකාර සමිතිය | 39 | 8 |
| 03 සී/ස මුද්‍රණ ශිල්පීන්ගේ සමුපකාර සමිතිය | 415 | 14 |
| 04 සී/ස සමස්ත ලංකා විචිත්‍ර පැලෑටි හා උඩවැඩියා වවන්නන්ගේ සමුපකාර සමිතිය | 2,747 | 12 |
| 05 සී/ස සමස්ත ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ධාන්‍ය සැකසුම්කරුවන්ගේ ව්‍යවසායකත්ව සංවර්ධන සමුපකාර සමිතිය | 286 | 01 |
| 06 සී/ස බන්ධනාගාර සේවා සැපයුම් සහ ගොඩනැගිලි ඉදිකිරීම් කම්කරු සමුපකාර සමිතිය | 53 | නැත |
| 07 සී/ස ශ්‍රී ලංකා මාදැල් හිමියන්ගේ සමුපකාර සමිතිය | 328 | නැත |
| එකතුව | 3,921 | 42 |